**සීමාසහිත ක්‍රිකට් ආධාර (ඇපකාර) සමාගම - 2021**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය ව්‍යාචනය

සීමාසහිත ක්‍රිකට් ආධාර (ඇපකාර) සමාගමේ (“සමාගම”) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගමේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාර, වාර්ෂික සහ කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි, සමාගමේ සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නිදන්ගත වකුගඩු රෝග අරමුදල සඳහා එක්සත් රාජධානියේ අරමුදල් රැස් කිරීමේ වැඩසටහන.<br>(i) වැඩසටහන් ආදායම<br>(ii) වැඩසටහන් වියදම්<br>(iii) රඳවාගත් ආදායම | <br><br><br><br>3,925,000<br>12,443,706<br>3,807,491 | මුද්‍රණය කරන ලද හා විකුණන ලද ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව, ප්‍රවේශපත්‍රවල මිල, වැඩසටහනේ පිරිවැය සහ වැඩසටහනෙන් අපේක්ෂිත ආදායම, වැඩසටහනේ කාලසීමාව, උත්සව කළමනාකරණ සමාගම තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය සහ ඔවුන්ගේ කාර්යභාරය, උත්සව කළමනාකරණ සමාගම සඳහා ගෙවීම, වෙන්දේසි කළ භාණ්ඩ පිළිබඳ විස්තර, ගෙවීම් වවුචර ඉන්වොයිසි, බැංකු තැන්පතු පත්‍රිකා, විස්තරාත්මක වාර්තා යනාදිය | මෙම ව්‍යාපෘතිය 2016 වසරේ සිදු කර ඇති බැවින් එය 2016 වසරේ මූල්‍ය ප්‍රකාශන වලට බලපෑමක් ඇති කරන නමුත් 2021 මූල්‍ය ප්‍රකාශන වලට එය බලපෑමක් සිදු නොකරයි. | එකතු කරන ලද මුළු අරමුදල හා වැඩසටහන වෙනුවෙන් කරන ලද මුළු වියදම් සත්‍යාපනය කිරීමට විගණනය වෙත ප්‍රමාණවත් ලෙස ලේඛන සපයා තිබිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 248,000 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 248,500 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 500 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව බැංකු ගාස්තු අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුව විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 සිට 2019 දක්වා කාලය තුළ සේවකයන්ගේ වැටුපෙන් අඩු කරන ලද රු. 86,360 ක ගෙවිය යුතු උපයන විට ගෙවිය යුතු බදු ශේෂය 2024 ජූලි 31 වන දින තෙක්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංකය නිකුත් කර නොතිබුණි. | උපයන විට ගෙවිය යුතු බද්ද දේශීය ආදායම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් කරන ලද නිර්දේශවලට අනුව සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර වසර තුනක් ගතවී ඇතත් සමාගම ඇවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වී නොමැත. | සමාගම මීට වසර තුනකට පෙර මෙහෙයුම් නතර කළද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ ඉල්ලීම පරිදි 2023 දක්වා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නොමැති වීම හේතුවෙන් ඇවර කිරීමේ හැකියාවක් නොමැත. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශය විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමටත් ඒ අනුව ඇවර කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත් කටයුතු කළ යුතුය. |